# පච්චේක බුද්ධ සංකල්පය පිළිබඳ ථෙරවාදී ආකල්පය

එන්. තුසිත චන්දන රාජපක්ෂ[1]

## හැඳින්වීම

බුද්ධ ශාසනයෙහි මූලිකපරමාර්ථය වන්නේ විමුක්තිය හෙවත් නිර්වාණය සාක්ෂාත් කරගැනීමයි. එසේ විමුක්තියට පත්විය හැකි තුන් ආකාරයක් පිළිබඳව ථෙරවාදය අනාවරණය කරයිගමහායානයෙහි විමුක්තියට පත්විය හැක්කේ බුද්ධත්වයෙන් පමණක් ලෙස විවරණය වුවද ථෙරවාදය තුළ විවරණය කරන්නේ තුන්තරා බෝධිය තුළින් තත්වයන් තුන් ආකාරයක් ඔස්සේ පුද්ගලයාට විමුක්තියට පත්විය හැකි බවයි. සම්මා සම්බෝධියට පත්වීමෙන්, පච්චේක බෝධියට පත්වීමෙන්, ශ්‍රාවක බෝධියට පත්වීමෙන්, පුද්ගලයාට එසේ විමුක්තියට පත්විය හැකි අතර මෙහිදී අවධානය යොමු වී ඇත්තේ පච්චේක බුද්ධත්වය පිළිබඳ විමර්ශණය කිරීමටයි. බුද්ධ බෝධිය සහ අරහත් ශ්‍රාවක බෝධිය පිළිබඳ බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රය තුළ වැඩි අවධානයක් යොමු වී තිබුණ ද පසේ බුද්ධත්ව සංකල්පය පිළිබඳ එතරම් අවධානයක් යොමු නොවීම හේතුවෙන් මෙහිදී පච්චේක බුද්ධ බෝධියෙහි ස්වභාවය ථේරවාදයෙහි විවරණය වන්නේ කෙසේද යන්න විමසීමට මූලික අවධානය යොමු කර තිබේ.

## පර්යේෂණ ගැටලුව

පච්චේක බුද්ධ සංකල්පය පිළිබඳ වර්තමානයෙහි සමාජගත වී ඇති දුර්මත බිඳ හෙළීමට ථෙරවාදී බුදු දහම තුළ විවරණය වන පච්චේක බුද්ධ සංකල්ප විවරණය උපයෝගී කරගත හැකිද?

## පර්යේෂණ ක්‍රමවේදය

පච්චේක බුද්ධ සංකල්පය පිළිබඳ ථෙරවාදි විවරණය විමසන කල්හි ත්‍රිපිටක අධ්‍යයනය ඉතා වැදගත් වෙයි. මෙම සංකල්පයෙහි තොරතුරු ගවේෂණය කිරීම සඳහා යොදාගත හැකි ප්‍රධාන මූලාශ්‍රය සාහිත්‍ය මූලාශ්‍රය බැවින් මෙහිදී ත්‍රිපිටකාගත සූත්‍ර දෙස වැඩි අවධානයක් යොමු කර තිබෙන අතර සූත්‍රගත තොරතුරු ඉතා අල්ප බැවින් ඊට අදාළ අට්ඨකතා සඳහා ද අවධානය යොමු කිරීමට සිදුවේ. පච්චේක බුද්ධ සංකල්පය ආශ්‍රිත ථෙරවාදී ආකල්පය විමසුමේ දී සූත්‍රගත තොරතුරුවල පවතින අල්පත්වය ප්‍රධාන ගැටලුවකි. අදාළ තොරතුරු ඒකරාශි කරගැනීමට සිදුවනුයේ බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ ද පරිශීලනය කරමින්ය. විශේෂයෙන්ම ජාතක පොත් වහන්සේ සතු ඇතැම් ජාතක කතා වස්තුන්හි ඇතැම් සිද්ධි සඳහා පසේ බුදුවරුන් පිළිබඳ ඉතාම සංක්ෂිප්ත සටහන් ඇතුළත් කොට ඇති

[1] උපාධි අපේක්ෂක, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
nthusithacr@gmail.com/

අතර සංක්ෂිප්ත වුව ද එවැනි සටහන් මෙම අධ්‍යයනය සඳහා මනා වූ පිටිවහලක් වෙයි. එහෙයින් ජාතක පොත් වහන්සේ, සද්ධර්මරත්නාවලිය, සද්ධර්මලංකාරය, පූජාවලිය ආදී සාහිත්‍ය ග්‍රන්ථ ද පාදක කරගනිමින් මෙම අධ්‍යයනය කරනු ලැබේ.

සාකච්ඡාව

පච්චේක බුද්ධ යන්නෙහි අදහස හුදකලාව සිටින්නා, තනිව අවබෝධ කළ තැනැත්තා, තවකෙකුගේ වචනයක් ඇසීමකින් තොරව චතුරාර්ය සත්‍ය අවබෝධ පුද්ගලයා යන්නයි. පච්චේක බුද්ධසංකල්පය පිළිබඳ ථෙරවාදී මතය විමසුමේ දී අංගුත්තර නිකායෙහි ථූපාර්හ සූත්‍රය සංක්ෂිප්තව ඉදිරිපත් කෙරෙන අදහස ඉතාම වැදගත් වෙයි. එම සූත්‍රය තුළ ස්තූප ඉදිකොට වන්දනාවට  පාත්‍ර කළයුතු පුද්ගයන් සතර දෙනෙකු පිළිබඳ දක්වන අතර බුදුරජාණන් වහන්සේට පසු ලොව සිටින ශ්‍රේෂ්ඨතම පුද්ගලයා පසේ බුදුරජාණන් වහන්සේ බව එහි අදහස් වෙයි. සුත්ත නිපාතයෙහි ඛග්ගවිසාණ සූත්‍රයෙහි පසේබුදුවරුන්ගේ අපදානයන් ඇතුළත් වන අතර මෙය සවිස්තරාත්මකව දැක්වෙන්නේ  සුත්තනිපාතට්ඨ කථාවෙහි ඛග්ගවිසාණ සූත්‍ර වර්ණනාවේදී ය. පච්චේක බුද්ධත්වය ලබාගැනීමට අසංඛෙය්‍ය දෙකකුත් කප් සියදහසකුත් පාරමී පූරණය කළ යුතු බව දැක්වෙන අතර තව ද පච්චේක බුද්ධත්වය ලැබීමට පූරණය විය යුතු සම්පත්ති විශේෂයක් ද වෙයි. මනුෂ්‍යයකු වීම, පුරුෂ ආත්මයක් ලැබීම, කායික විපර්යාස නොවීම ඒ අතර පමුඛස්ථානයක් ගනී. පච්චේක බුදුවරුන් පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී මජ්ඣිම නිකායේ ඉසිගිලි සූත්‍රය තුළින් පසේ බුදුරජාණන් වහන්සේලාගේ නාමයන් රාශියක තොරතුරු හෙළිවෙයි. අරිට්ඨ, උපරිට්ඨ, තගරසිඛි, යසස්සි, සුදස්සන, පියදස්සී, ගන්ධාර, පිණ්ඩෝල, උපසභ, නීථ, තථ, සුතවා, භාවිතත්ථ ලසුම්භ, සුභ, මේථුල, අට්ඨම, මේඝ, අනීඝ, සුදාඨ, පදුම ආදී පසේබුදුවරුන් පිළිබඳ නාමයන් ඒ අතර වෙයි. ජාතක පොත් වහන්සේ ජාතක කතා ආශ්‍රයෙන් පසේ බුදුවරුන්ගේ සංක්ෂිප්ත තොරතුරු හෙළි කර තිබෙන අතර ඡද්දන්ත ජාතකය, කුස ජාතකය ආදි ජාතක කතා තුළ එවැනි සංක්ෂිප්ත සටහන් දක්වා ඇත. විශේෂයෙන්ම ජාතක කතා තුළින් පසේ බුදුවරුන් උදෙසා පිදෙන දානයන්හි ආනිසංශ තත්වයෙහි අග්‍රත්වය මැනවින් විවරණය කරන අතර උන්වහන්සේලාගේ හුදකලා ජීවිතය ද පෙන්නුම් කරයි. ථෙරවාදයෙහි විස්තර වන පසේ බුදුරජාණන් වහන්සේලා තම හුදකලා වූ ජීවිතය ගත කිරීම උදෙසා තෝරාගෙන ඇත්තේ පර්වත ආශ්‍රිත වනාන්තර ය. පසේ බුදුවරුන් අල්ප වචන භාවිත කරන පිරිසකි. ථෙරවාදී සම්ප්‍රදාය තුළ පිළිගැනෙන මතයක් වනුයේ පසේ බුදුරජාණන් වහන්සේලාට තවත් අයෙකුට අවබෝධය සකස් වන අයුරින් ධර්මය දේශනා කළ නොහැකි බවයි. මෙම මතවාදය ප්‍රශ්නාර්ථයට තුඩු දෙන්නකිග මන්ද යත් රහතන් වහන්සේ කෙනෙකු වීමට පිරිය යුතු පාරමී ධර්ම අභිබවා පාරමී පූරණය කරන පසේ බුදුවරුන් මෙවැනි දුර්වල තත්වයකට පත්වන්නේ ද ගැටලුවක් වන හෙයිනි. පසේ බුදුරජාණන්

වහන්සේලා තවකෙකුට ධර්මය දේශනා කිරීමට නොයනුයේ එවැනි වූ ගැඹුරු දහමක් අවබෝධ කිරීමට තරම් නුවණැති අයෙකු එම යුගය තුළ නොමැති නිසා විය හැකියි. විශේෂයෙන්ම බුදුරජාණන් වහන්සේ නමක් වුවද බුද්ධත්වය ලබාගෙන එම ධර්මය දේශනා කිරීමට සුදුසු පිරිසක් සොයනුයේ එම අවබෝධය ලැබීමට අදාළ නුවණ තිබිය යුතු පිරිස් සිටිය යුතු හෙයිනි. පසේ බුදුවරුන් වහන්සේලා බුදුවරයෙකු පහළ වූ පසු එම සම්බුද්ධ ශාසනයෙහි පහළ නොවීම සාම්ප්‍රදායික අදහසයි. තව ද ගෞතම බුදුරජාණන් වහන්සේ පහළවීමට පෙර ඊට පෙර යුගයෙහි අවසාන පසේ බුදුරජාණන් වහන්සේ මාතංග නම් නාමයක් දැරූ පසේ බුදුරදුන් බව අටුවාව විස්තර කරයි. බුද්ධ සංකල්පය සහ පච්චේක බුද්ධ සංකල්පය තුලනාත්මකව අධ්‍යයනය කිරීමේ දී බුදුරජාණන් වහන්සේලා සහ පසේබුදුවරුන් අතර දැකිය හැකි සම විෂමතා විවරණය වෙයි. බුද්ධත්වය සහ පසේබුද්ධත්වය සාක්ෂාත් කර ගන්නා අවසන් ආත්මභාවය මනුෂ්‍ය ආත්මභාවයක් වීම (මනුස්සත්තං), පුරුෂ ආත්ම භාවයක් වීම (ලිංග සම්පත්ති), පරමාර්ථය උදෙසා උසස් ලෙස යහපත් දේ කිරීම (අධිකාරො), ලිංග විපර්යාස ආදිය නොවීම, පොදු සම ලක්ෂණ වෙයි. එලෙසම මෙම සංකල්ප ද්විත්වය අතර පවත්නා විෂමතා ලෙස, බුද්ධත්වය ලබන ආත්ම භාවය සඳහා බෝසත්වරුන් පස්මහ බැලුම් ආදිය බැලුව ද පසේබුදුවරුන්ගේ එවැනි නියතයක් නොමැති වීම, ගිහිව සිටියදීම වුවද යම් සිද්ධියක් මුල් කරගෙන පසේ බුද්ධත්වය සාක්ෂාත් කරගැනීම, විශේෂයෙන්ම ඥාණ දර්ශනය අතර පවත්නා පරස්පර ස්වභාවය ආදිය දැකිය හැකිය. බුදුරජාණන් වහන්සේලා සතුව කායික පිහිටීම ගත් විට සුවිශේෂිත්වයක් දැකිය හැකිය. විශේෂයෙන්ම දෙතිස් මහා පුරුෂ ලක්ෂණ පිහිටීම බුදුවරුන් සතු සුවිශේෂි ලක්ෂණයකි. පසේ බුදුවරුන් බවට පත්වන පිරිස්ගේ කායික ස්වරූපයෙහි එවැනි සුවිශේෂිත්වයක් දැකිය නොහැකිය. මහායානය තුළ විමුක්තිය ලැබීමට බුද්ධත්වය පමණක් අවශ්‍ය බව කියැවෙන නිසාම පුද්ගලයන් අතරත බුද්ධ සංකල්පයෙහි ප්‍රසාරණය වීමක් පවතියි. මෙම මතවාදය පාදක කොට ගනිමින් ඇතැම් පිරිස් ථෙරවාදයෙහි සඳහන් පච්චේක බුද්ධ සංකල්පය කෙරෙහි මහායානික බලපෑම සිදු වී ඇතැයි මත පළකරයි. බුදුවරු සහ පසේ බුදුවරුන් අතර ඇති සම විසමතා හඳුනා ගැනීම තුළින් එම මතය බැහැර වෙයි. පසේ බුදුවරුන් යනු රහතන් වහන්සේලාට වඩා පාරමී පූරණය කරන ලද රහතුන් විශේෂයක් මිස මහායානික ආභාසය නිසා සකස් වූ සංකල්පයක් නොවේ.

යම් යම් පර්යේෂණ කාර්යයන්හි දී පුරාවිද්‍යාත්මක සාධකයන් ඉවහල් වුව ද පච්චේක බුද්ධ සංකල්පය පිළිබඳ අධ්‍යයනයේ දී පුරාවිද්‍යාත්මක සාධකයන් එතරම් බලපෑමක් සිදුනොකරයි. එයට හේතුව වන්නට ඇත්තේ ලොව බෞද්ධ යුගය ඇරඹෙන්නේ බුදුවරයකුගේ පහළ වීමෙන් නිසා එසේ පහළ වීමෙන් පසු පසේබුදුවරුන් පහළ නොවීමත් සමග එම පසේබුදු යුගය මිනිසුන්ගෙන් දුරස්ථ වී යාම විය හැකිය. කෙසේ නමුත් ඉන්දු නිම්න ශිෂ්ටාචාර සාදක තුළින් හමුවන

පිළිරුවක් පසේබුදුවරයකු නිරූපණය කිරීමක් ලෙස ඇතැමුන් මත පළ කර ද එයට නිශ්චිත නිගමනයක් නැත. සෙල්ලිපි චිත්‍ර ආදිය තුළින් ද නිශ්චිත තොරතුරක් පසේබුදුවරුන් පිළිබඳ නොලැබෙයි.

## නිගමනය

වත්මන් ජන සමාජය තුළ පච්චේක බුද්ධ සංකල්පය පිළිබඳ වැඩි අවධානයක් යොමු නොවීම තුළ මෙම සංකල්පය පිළිබඳව යම් යම් දුර්මත සමාජගත වී තිබේ. එහි දී එවැනි දුර්මත ලෙස පච්චේක බුද්ධ සංකල්පය තුළ මහායානික සංකල්පගත ලක්ෂණ පැවතීම තව ද පසේ බුදුවරුන් පිළිබඳ සඳහන් ඉසිගිලි සූත්‍රය ආදී සූත්‍රාදිය මහායානික ආභාසය ගත් සූත්‍ර ආදි මතවාද සඳහන් කළ හැකිය. මෙම මතවාද කාලයාගේ ඇවෑමෙන් සමාජගත වූ බවත් එයට හේතුව පසේ බුදුවරුන් පිළිබඳ සූත්‍රගත තොරතුරු අල්ප වීම හා ඒ පිළිබඳ අවධානය අල්ප බවත් සඳහන් කළ හැකිය. වර්තමාන සමාජය තුළ පච්චේක බුද්ධ සංකල්පය කෙරෙහි වැඩි අවධානයක් යොමු නොවුණ ද ථෙරවාදය තුළ පච්චේක බුද්ධ සංකල්පය විවරණය වන්නේ සම්මා සම්බුද්ධත්වයට පසු ලොව ඇති උසස්ම පදවිය පසේ බුද්ධත්වය බව පසක් කරමින් බව සඳහන් කළ හැකිය. තව ද පච්චේක බුද්ධ සංකල්පයෙහි ථෙරවාදී ආකල්පය විමසීමට ථෙරවාදී සූත්‍රාගත තොරතුරු ඉවහල් කරගත හැකි බවත් සඳහන් කළ හැකිය.

ප්‍රමුඛ පද : පච්චේක බුද්ධ, ථෙරවාද, මහායාන, නිර්වාණය

## ආශ්‍රිත ග්‍රන්ථ

*අපදාන පාළි* 1, ඛුද්දක නිකාය, බු. ජ. ත්‍රි. ග්‍ර. මා, අංක 36, (පරි.) තලල්ලේ ධම්මානන්ද. (1961). ලංකාණ්ඩුවේ ප්‍රකාශනග

*මිලින්ද පඤ්ඤා.* (සංස්.) ආනන්ද මෛත්‍රෙය මහථේරො. (1962). මරදානඃ ග්‍රන්ථ ප්‍රකාශනග

*සුත්තනිපාතයට්ඨකථා,* (පරි.) රංජිත්, ජේ. පී. නිමල් ලාල්. (2008). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයග

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ (2008.) *පාළි සාහිත්‍යය ඉතිහාසය.* කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ප්‍රේමසිරි, පි. ඩි. (පරි.) (2016). *බෞද්ධ ශබ්දකෝෂය.* මහනුවර බෞද්ධ, ග්‍රන්ථ ප්‍රකාශන සමිතියග